# ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය (මාඕවාදී)

## මධ්‍යම කාරක සභාව

*2010 නොවැම්බර් 30*

**ආදරණීය සොහොයුරනි ඉන්දියානු විප්ලවයේ මිතුරනි,**

ෆැසිස්ට්වාදී ඉන්දියානු පාලක පංතිය විසින් 2010 ජුලි 01 වන දින චෙරුකුරි රාජ්කුමාර් (අෂාඩ්) සහ හෙම්චන්ද් පාන්ඩ් යන සහෝදරවරු කෲර ලෙස ඝාතනය කිරීම හෙලා දකිමින් අපේ මධ්‍යම කාරකසභාවට ශෝක පණිවුඩ එවූ ඉන්දියාවේ සිට විදේශයන් දක්වා වූ, සියළුම පක්ෂ, සංවිධාන, විවිධ සමිති සහ පුද්ගලයින් වෙත, අපේ පක්ෂය වන ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය (මාඕවාදී) වෙනුවෙන්, මහජන විමුක්ති ගරිල්ලා හමුදව වෙනුවෙන්, විප්ලවීය ජනතා කමිටු වෙනුවෙන්, විප්ලවීය ජනතා සංවිධාන සහ ඉන්දියාවේ විප්ලවීය ජනතාව වෙනුවෙන්, පළමුවෙන්ම අපේ හෘදයාංගම රතු ආචාරය (ලාල් සලාම්) පුද කරමු. ඉන්දියානු විප්ලවයට සහ අපේ පක්ෂයට සිදු වූ එක් බරපතළ හානියක් වන සහෝදර අෂාඩ් ගේ අහිමිවීම ගැන ශෝකයෙන් පෙළුණ ඔබ හැමට කෘතඥතාව හිමිවිය යුතුව තිබේ. අෂාඩ් වූ කලී අපේ පක්ෂයේ ඉහළම පෙළේ නායකයෙකි. දිගු කාලයක සිට ඔහු ඉන්දියානු විප්ලවය මෙහෙයවමින් සිට තිබුණි. අපේ රටේ ගතවන සෑම දිනයකදීම මහජන යුද්ධය තියුණු වෙමින් පවතී. අධිරාජ්‍යවාදීන්ගේ සහ විශේෂයෙන්ම ඇමෙරිකානු අධිරාජ්‍යවාදීන්ගේ සහය ඇතිව, ඉන්දීය ප්‍රතිගාමී පාලක පංතිය විප්ලවීය ව්‍යාපාරය මැඩ පැවැත්වීමට වෙර දරමින් සිටින අතර පෙර නොදුටු විරූ දරුණු ආකාරයකට අනුකම්පා විරහිත දමරික කම් සිදු කරමින් සිටී. ජනතාව සහ පාලක පංතිය අතර වන මේ යුද්ධය තුළ දී, සතුරා විශේෂයෙන්ම අපේ නායකයින් ඝාතනය කිරීමට කූටෝපායයන් යොදමින් තිබුණ අතර සහෝදර අෂාඩ් වැනි විප්ලවයේ නායකින් වට කිරීමට පටන් ගෙන ඇත. බියගුළු ක්‍රමයකට අනුව සහෝදර අෂාඩ්ව අල්ලාගෙන ඉතාමත් සැහැසි ආකාරයකට ඔහුව ඝාතනය කිරීම මේ කූට උපක්‍රමයේ කොටසකි. සහෝදර අෂාඩ් අපේ මධ්‍යම කාරකසභාව වෙනුවෙන් සමස්ත නාගරික ව්‍යාපාරය මෙහෙයවමින් සිටි අතර දේශපාලනික ප්‍රචාරණ කටයුතු, පක්ෂයේ වාර සඟරා, පක්ෂ අධ්‍යාපනය සහ එවැනි වෙනත් තීරණාත්මක වගකීම් දරමින් සිටියහ. ඔහු වූ කලී වඩාත්ම ජනප්‍රියම සහ වඩාත්ම පළපුරුදු සහිත වූ නායකයෙකි. ඔහු විවිධ මට්ටම්වල සහෝදරවරු සමග සහ විප්ලවීය ජනතාව සමග සමීප සම්බන්ධතා පවත්වා ගත්හ. තියුණු මර්ධනයන් මධ්‍යයේ ඔහු තමා ගැන නොසිතා විවිධ අන්තරායන්වලින් ගහණව තිබියදීත් අභීතව වැඩ කළ අයෙකි. එවැනි තත්ත්වයක් යටතේ සතුරා ඔහුගේ ආගිය තැන් සොයාගෙන යම් යම් තැන්වලට පැමිණ රැක සිට හිඳිමින් ඔහුව අල්ලා ගත්හ.

සැබෑ ජාත්‍යන්තරවාදී ආත්මය නිදහස් කළ ඔබේ පණිවුඩ සහ ශෝක ප්‍රකාශයන් වූ කලී මේ කම්පා සහගත ප්‍රවෘත්තියෙන් ශෝකී හරිතව සිටින පීඩිත ජනතාවට සහ සහෝදරවරුන්ට අවශ්‍යම වූ ධෛර්යය ලබා දීමකි. මෙහි පැවති තියුණු මර්ධනකාරී තත්ත්වය යටතේ සියළුම පණිවුඩ අපිට නොලැබී ගිය අතර අප අතට පත් වූ ඒවා පවා ලැබුණේ බෙහෙවින් ප්‍රමාද වීය. එබැවින් ඔබට පිළිතුරක් එවීමට ප්‍රමාද වීම ගැන අපි බෙහෙවින් කණගාටුවට පත්වීමු.

සහෝදර අෂාඩ් විප්ලවීය ව්‍යාපාරයට ආකර්ෂණය වූයේ 1972 දී වරංගාල් කලාප ඉංජිනේරු විද්‍යාලයේ අධ්‍යාපනය ලබන අතරතුරදීය. කිසිදු සැකයකින් තොරව අධ්‍යයන කටයුතුවලදී දීප්තිමත් අයෙකු වූ අෂාඩ් විප්ලවීය ව්‍යාපාරය තුළද බෙහෙවින් ක්‍රියාශීලී අයෙකු විය. 1974 දී රැඩිකල් ශිෂ්‍ය සංගමය ඉදිකිරීමේදී ඔහු ද දයකත්වය සැපයීය. 1978 දී රැඩිකල් ශිෂ්‍ය සංගමයේ ප්‍රාන්ත සභාපති ලෙස තේරී පත් වූහ. ඔහු සමස්ත ඉන්දියානු විප්ලවීය ශිෂ්‍ය ව්‍යාපාරයේ ආරම්භක සාමාජිකයෙකු වූ අතර එය ආරම්භ වූ 1985 සිටම එයට මග පෙන්වූහ. 1981 දී එවක මදුරාසි නගරයේ ජාතික ප්‍රශ්නය ගැන සම්මන්ත්‍රණයක් පැවැත්වීමේදී වැදගත් කාර්යභාරයක් ඉටු කළහ. පසුව ඔහු කර්නාටක ප්‍රදේශයේ විප්ලවීය ව්‍යාපාරය ගොඩ නැගීමේ වගකීම් භාරගත් අතර එම ප්‍රාන්තයේ පළමු වතාවට මාඕවාදී පක්ෂය ගොඩ නැගූහ. සකේත් රාජන් වැනි බොහෝ සහෝදරවරු ඔහු පක්ෂයට ආකර්ෂණය කර ගත්හ. 1985 දී සහ 1991 දී අවස්ථාවාදී මූලයන් අපේ පක්ෂය බෙදීමට තැත් දරන විට, අපේ පක්ෂ මාවත ආරක්ෂා කර ගැනීමට සහෝදර අෂාඩ් තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරමින් ඔවුන්ගේ අවස්ථාවාදී දේශපාලන මතයන් පරාජය කරමින් පක්ෂය එක්සත්ව සහ ශක්තිමත්ව තබා ගත්හ. ඔහු විසි වසරක් වෙහෙස නොබලා මධ්‍යම කාරකසභාවේ සාමාජිකයෙකු ලෙස වැඩ කළ අතර 1990 සිට මේ දක්වා දේශපාලන මණ්ඩලයේ සාමාජිකයෙකුව සිටියහ. පසුගිය හතලිස් වසරක විප්ලවීය ව්‍යාපාරයේ ඉතිහාසය තුළින් සහෝදර අෂාඩ්ව වෙන් කළ නොහැක. විශේෂයෙන්ම ඔහු මතවාදීමය, දේශපාලනිකමය විෂයන්හි, පක්ෂ අධ්‍යාපනයේ සහ සඟරා පවත්වා ගැනීමේදී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළහ. වසර තුනක් තිස්සේ ඔහු පක්ෂයේ මාධ්‍ය ප්‍රකාශක ලෙස ''අෂාඩ්'' යන නමින් අති දක්ෂ සහ ආදර්ශමත් ආකාරයකට එහි වගකීම් ඉෂ්ට කළහ. මන්මෝහන් සිං-සෝනියා-චිදම්බරන් කල්ලිය විසින් මෙහෙයවනු ලැබූ 'ජනතාවට එරෙහි යුද්ධය' ට එරෙහිව ප්‍රතිපහර දීමේදී ඔහු සිය තියුණු පෑන සහ ඔහුගේ බුද්ධිය කැපී පෙනෙන ලෙස මෙහෙයවූහ. පාලක පංතියට සහ සූරාකන්නන්ට එරෙහිව ඔහු ජනතාවගේ බලසම්පන්න හඬක් ලෙස නැගී සිටියහ. පක්ෂයේ දේශපාලන මාවත සංවර්ධනය කිරීම තුළ, පක්ෂය, ජනතා හමුදව සහ මහජන සංවිධාන සංවර්ධනය කිරීම තුළ, ව්‍යාපාරය පුළුල් කිරීම තුළ, නව ප්‍රජාතන්ත්‍රවාදී බලයේ අවයවයන් පහළවීම තුළ සහ දිනා ගනු ලැබූ සියළුම ජයග්‍රහණයන් තුළ, අෂාඩ්ගේ මතවාදී, දේශපාලනික වැඩ සහ ප්‍රතිපත්ති තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළහ. ඕනෑම වාසි සහගත හෝ අවාසි සහගත මුහුණුවරකදී පසුබට නොවන කැපවීම සහ ව්‍යාපාරයේ වඩදිය සහ බාදිය අවස්ථාවන්හිදී, අතිශය පරිත්‍යාගශීලී ස්වභාවය, පරාර්ථකාමීබව, සරල දිවි පැවැත්ම, විප්ලවය සහ ජනතාවගේ අභිලාෂයන් වෙනුවෙන් ඉතා වෙහෙස වී වැඩ කිරීම, විශ්මයජනක අධ්‍යයනය, කාලෙන් කාලෙට සමාජ සංසිද්ධීන් වෙනස්වීම ගැන අධ්‍යයනය කිරීම, හැමවිටම ජනතාව සමග පැවතීම ආදිය සහෝදර අෂාඩ් විසින් ඉදිකරනු ලැබූ ශ්‍රේෂ්ට නිර්ධන පංතික පරමාදර්ශයන්ගෙන් සමහරකි. ඔහු අද නොවූවද සැකයක් නැතිවම ඔහු, සෑම විප්ලවවාදියෙකුටම සහ විශේෂයෙන්ම තරුණයන්ට, ශිෂ්‍යයන්ට සහ බුද්ධිමතුන්ට ආදර්ශ විප්ලවවාදී චරිතයක් ලෙස සේවය කළහ.

හෙම්චන්ද් පාන්ඩ් වූ කලී අට්ටරක්හාන්ඩ් වලින් පැමිණි, අපේ රටේ දිළිඳු පීඩිත ජනතාවගේ අවාසනාවන්ත පැවැත්මට ආලෝකය රැගෙනයාමට සිය පෑන භාවිතා කරනු ලැබූ ප්‍රගතිශීලී නිදහස්කාමී මාධ්‍යවේදියෙකි. අෂාඩ්ගේ මරණය පිටුපස වූ සත්‍යය හෙළිදරව් කරන නිසා ඔහුව මරා දමන ලදි. තරුණ දළුලමින් තිබුණු බුද්ධියක් සතු වූ මේ

ජනතාවාදීන් සැහැසි ලෙස මරා දැමීම ෆැසිස්ටවාදීන්ගේ දයාවක් නොමැති බවට තවත් හොඳ නිදර්ශනයකි.

ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය (මාඕවාදී) හි නායකත්වය යටතේ වෙන කරවරදකටත් වඩා විහිදෙමින් පවතින විප්ලවීය ව්‍යාපාරය හප කර දැමීමට සහ ජනතාව සහ පක්ෂය නායකත්වයක් නොමැති තත්ත්වයකට පත් කිරීමට ඉන්දියානු පාලක පංතිය යෙදූ කූට කුමන්ත්‍රණය තුළ වූ අෂාඩ් ඝාතනය කිරීම එළිදරවු කිරීම මගින් ඔබ සාධාරණ ලෙස මේ භයානක මිනීමරුවන් හෙලා දක තිබේ. 'සටන්' යන ව්‍යාජයෙන් පසුගිය 40 ස් වසර පුරාම අපේ නායකයන් ඝාතනය කිරීමේ ක්‍රියා මාර්ගය තුළ අෂාඩ්ගේ ඝාතනය විශේෂයෙන්ම 2007 දී පැවැත් වූ 9 වැනි සම්මේලනය තුළින් එක්සත් වීම සම්පූර්ණ කර ගැනීමෙන් පසු ව සිදු වූ සහ මෑතකදී සිදු වූ බරපතලම ඝාතනය වෙයි. රට තුළ තිබෙන විශාලතම අභ්‍යන්තර ආරක්ෂක තර්ජනය ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය (මාඕවාදී) ලෙස රජය ප්‍රකාශ කර තිබුණු අතර ව්‍යාපාරය විනාශකර දැමීමට විවිධ මර්ධනයන් දියත් කළහ, 2009 මැද සිට ක්‍රියාත්මක වන හරිත දඩයම් මෙහෙයුම ළඟදී ඇරඹුණි. විප්ලවීය ව්‍යාපාරය වෙතට මේ තාක් ඉන්දියාව තුළ දියත් කෙරුණු විශාලතම ආක්‍රමණය මෙය වන අතර එහි ප්‍රථිඵලයක් ලෙස ජනතාවගේ ජීවිත පෙර නොදුටු විරූ ලෙස විනාශ වූහ. අතිරේකව-නීත්‍යානුකූල ලෙස නායකයින් මරා දැමීම සහ ජන සංහාර යන මේ සියල්ල මේ ප්‍රතිවිප්ලවීය බහු දැති මෙහෙයුමේ අංගයෝ වෙති.

ඉන්දියානු ජනතාවට එරෙහි, විශේෂයෙන්ම ආදිවාසීන්ට එරෙහි මේ යුද්ධය හෙළා දකින ඔබ සැම, යුක්ති සහගත කෝපයකින් යුතුව එය වහාම නවතා දැමිය යුතු බවට බල කරති. මෙවැනි ෆැසිස්ට් ආක්‍රමණයකට මුහුණ දුන් මොහොතක ඕනෑම අව්‍යාජ ජනතා ව්‍යාපාරයකට විස්තීර්ණ වීම සඳහා නිසැකයෙන්ම දෙනු ලබන සහයෝගයක් බඳු වූ විවිධ රටවල විවිධ පක්ෂ, සංවිධාන, පුද්ගලයින් සහ නිර්ධනීන් විසින් පළ කරන ලද ජාත්‍යන්තර සහයෝගීතාවය විප්ලවීය ව්‍යාපාර ප්‍රදෙශවල ජනතාව උණුසුම් ලෙස සිය මතකයේ තබා ගනු ඇත. මේ වර්ගයේ සහයදීම් සහ සහයෝගීතාවයන් අප ඉතා ඉහළින්ම අගය කරන අතර විශ්වය තුළ විවිධ කොටස්වල සටන් වදින ජනතාවට ද අපි එලෙසම අන්‍යෝන්‍යව සහය දක්වන බව ඉතා දැඩි ලෙසම ප්‍රකාශ කොට සිටින්නෙමු. මේ වර්ගයේ සහයෝගීතාවයන් සටන් කරන ජනතාවට, ඔවුන්ගේ සටනේදී ඔවුන් හුදෙකලා නොවන බව හඟවමින් ශ්‍රේෂ්ට බලාපොරොත්තු සහගත බවක් සහ ආත්ම විශ්වාසයක් ඇති කරයි. අධිරාජ්‍යවාදය ලෙස හඳුන්වන පොදු සතුරෙකුට සහ සෑම වර්ගයකම ප්‍රතිගාමීන්ට අප සැම තවත් වරක් මුහුණ දෙමින් සිටින බව තියුණු ලෙස මතුවී පෙනෙයි. එය ජනතාවගේ සටන් කිරීමේ ආත්මය ඉහළ දැමීමට සහ ස්ථිර ලෙස විප්ලවීය ව්‍යාපාරය ඉදිරියට ගෙන යෑමට උදව් කරයි. අපේ පක්ෂය, මහජන විමුක්ති හමුදාව, විප්ලවීය ජනතා කමිටු, විප්ලවීය ජනතා සංවිධාන, විප්ලවීය ජනතාව සහ අපේ රටේ සියළු ප්‍රගතිශීලී සහ ප්‍රජාතන්ත්‍රවාදී බලවේග දේශීයව සහ ජාත්‍යන්තරව පවතින එවැනි එක්සත්කමකට සහ සහයෝගීතාවයකට ඒකාන්තයෙන්ම සුභ පතනු ඇත. විප්ලවීය ව්‍යාපාරය ආරක්ෂා කිරීමට සහ වර්ධනය කිරීමට එය අතිශයින් වැදගත් වේ.

සහෝදර අෂාඩ් ඇතුළු ලෝක නිර්ධන පංතියේ  ශ්‍රේෂ්ට දිවි පිදූවන් හැම කෙනෙකුගේම උදාර අරමුණු රැගෙන යන බවට අපි නැවත වරක් ඔබ සැම ඉදිරියේ සහතික වෙමු, තවද ෆැසිස්ට් මර්ධනයට අපේ පක්ෂයේ සහ ඉන්දියාවේ විප්ලවීය ජනතාවගේ සටන්කාමී ආත්මය බෙලහීන කළ නොහැකි බව නිවේදනය කර සිටිමු. අපි නවමු ලෙස පණ ගැන්වුණු ධෛර්යයකින් යුතුව ඕනෑම වාසි සහගත හෝ අවාසි සහගත තත්ත්වයකදී නොසැලී සිට ජීවිත පරිත්‍යාගයෙන් යුතුව අවසන් ජයග්‍රහණය දක්වාම පෙරට යන්නෙමු. මෙය ඉන්දියානු විප්ලවයේ සියළුම මිතුරන්ට සහ හිතවතුන්ට අප විසින් දෙනු ලබන පොරොන්දුවකි.

- ★ **නිර්ධන පංති ජාත්‍යන්තරවාදය දිගුකල් දිනේවා!**

- ★ **ලොව පුරා පීඩිත ජනතාවගේ සහ ජාතීන්ගේ, විප්ලවීය සහ ප්‍රජාතන්ත්‍රවාදී බලවේගයන්ගේ, ජාත්‍යන්තර නිර්ධන පංතිකයින්ගේ එක්සත්කම දිගු කල් දිනේවා!**

*විප්ලවීය සුභපැතුම් සමග,*

Abhay

**(අභේ)**

**මාධ්‍ය ප්‍රකාශක,**

**මධ්‍යම කාරකසභාව,**

**ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය (මාඕවාදී)**